# වැටුප් සඳහා ගැලපුම්

## වැටුප් ලේඛණය

යම්කිසි කාල පරිච්ඡේදයක් සඳහා එක් එක් සේවකයාගේ වැටුප වෙන්වෙන් වශයෙන් දැක්වෙන පරිදි සියලූ ම සේවකයන්ගේ වැටුප් ඇතුළත් ලේඛණය යි.

**වැටුප් ලේඛණයක ආකෘතිය**

මාසයේ වැටුප් ලේඛණය

| අනුක්‍රමික අංකය | සේවක අංකය | සේවකයාගේ නම | මූලික වැටුප | දීමනා | ඒකාබද්ධ වැටුප | අතිකාල දීමනා | දළ වැටුප | අඩු කිරීම් | | | මුළු අඩු කිරීම | ශුද්ධ වැටුප | E.P.F සඳහා සේවායෝජකයාගේ දායකය | E.T.F සඳහා සේවායෝජකයාගේ දායකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | අත්තිකාරම් | සේවක ණය | වෘත්තීය සමිති දායක මුදල් | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

## සේවක අර්ථසාධක අරමුදල් ගැලපීම (E.P.F.)

මෙම අරමුදලේ සාමාජිකයින් වෙනුවෙන් දායක මුදල් ගෙවීමේ වගකීම සේවායෝජක හෙවත් සේව්‍යයා වෙත පවරා ඇත. සේවකයාගේ දළ වැටුපෙන් 8% ක් අඩුකර සේවායෝජක විසින් 12% ක් එකතු කර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට බැර කිරීම පිණිස යැවිය යුතුය. යම් මාසයක දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දින හෝ ඊට පෙර අරමුදලට බැර වන පරිදි යැවිය යුතුය.

**ද්විත්ව සටහන්**

(1) දළ වැටුප්

..............................................................................................................

..............................................................................................................

(2) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයින්ගේ දායකය

....................................................................................................................

....................................................................................................................

(3) ශුද්ධ වැටුප්

....................................................................................................................

....................................................................................................................

(4) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍යයාගේ ආයතනයේ දායකය

....................................................................................................................

....................................................................................................................

**සටහන**

වැටුප් ගිණුමේ ශේෂය (දළ වැටුප්) හා සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමේ ශේෂය (සේව්‍යයාගේ දායකය) වියදමක් ලෙස සලකා ආදායම් ප්‍රකාශයට හර කළ යුතුය.

## සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් ගැලපීම (E.T.F.)

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල යටතේ සේවකයින් වෙනුවෙන් දායක මුදල් ගෙවනුයේ **සේවා යෝජක හෙවත් සේව්‍යයා විසිනි.** සේවකයාගේ වැටුපෙන් ඒ සඳහා අඩු කර ගැනීමක් සිදු නොවේ. ගෙවිය යුතු දායක මුදල සේවකයින්ගේ දළ වැටුපෙන් 3% කි. යම් මාසයක දායක මුදල් ඊලඟ මාසයේ අවසාන දින හෝ ඊට පෙර අරමුදලට බැර වන පරිදි ගෙවිය යුතු ය.

**ද්විත්ව සටහන්**

....................................................................................................................

....................................................................................................................

**සටහන**

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් ගිණුමේ ශේෂය වියදමක් ලෙස සලකා ආදායම් ප්‍රකාශයට හර කළ යුතු ය.

## අභ්‍යාසය 75

2019 දෙසැම්බර් මාසය සඳහා සීමාසහිත මහී (පෞද්ගලික) සමාගමේ වැටුප් ලේඛනයෙන් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| මූලික වැටුප (රු.) | අතිකාල (රු.) | සේවක අර්ථසාධක අරමුදලට අඩුකිරීම් (8%) (රු.) | ශුද්ධ වැටුප (රු.) |
|---|---|---|---|
| 10,875,000 | 13,650,000 | 870,000 | 23,655,000 |

සේවක අර්ථසාධක අරමුදල්ට සහ සේවක භාර අරමුදලට සමාගමේ දායකත්වය මූලික වැටුපෙන් පිළිවෙලින් 12% ක් සහ 3% ක් වේ.

මාසික වැටුප් ගෙවීම අදාල මාසයේ අවසාන වැඩකරන දිනයේ ගෙවනු ලබන අතර, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම ඊළඟ මාසයේ 10 දින ගෙවනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ.**

**සීමාසහිත මහී (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

(a) වැටුප් පාලන ගිණුම

(b) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම

(c) ගෙවිය යුතු සේවක භාර අරමුදල් (ETF) ගිණුම

## අභ්‍යාසය 76

**සීමාසහිත පේ වෙල් (පෞද්ගලික) සමාගමේ** 2017 දෙසැම්බර් මාසය සඳහා වැටුප් විස්තර පහත දැක්වේ.

| මූලික වැටුප (රු.) | දීමනා (රු.) | දළ වැටුප (රු.) | ණය වාරික (රු.) | සේවක අර්ථසාධක අරමුදලට අඩු කිරීම (රු.) | ශුද්ධ වැටුප (රු.) |
|---|---|---|---|---|---|
| 8,700,000 | 5,400,000 | 14,100,000 | (2,300,000) | (696,000) | 11,104,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකය මූලික වැටුප මත ගණනය කරයි..

(2) සේවක අර්ථසාධක අරමුදලට සේවකියින්ගේ සහ සමාගමේ දායකත්වය පිළිවෙලින් 8% ක් සහ 12% ක් වේ.

(3) සේවක භාරකාර අරමුදලට සමාගමේ දායකත්වය 3% කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් ගනුදෙනුවලට අදාල සටහන් ද ඇතුළුව පිළියෙල කරන්න. **(AAT - AA2 - January 2018)**

## අභ්‍යාසය 77

සීමාසහිත සවුත්පොල් (පෞද්ගලික) සමාගමේ ගිණුම් පොත්වලින්, 2018 මාර්තු මාසය සඳහා පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී.

| | |
|---|---|
| උපයන විට ගෙවීම් (PAYE), ණය වාරික සහ සේවක අර්ථ සාධක අරමුදල (EPF) (8%) | 7,320,000 |
| උපයන විට ගෙවීම් (PAYE) | 180,000 |
| ණය වාරික අඩුකිරීම් | 50,000 |

සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් 8% ක් අඩුකරනු ලැබේ. මූලික වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% ක් බැගින් සමාගම විසින් දායක වේ. සේවකයන්ගේ වැටුප් 2018 මාර්තු 31 දිනද, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක 2018 අප්‍රේල් 10 දිනද සිදුකරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2018 මාර්තු මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

(a) වැටුප් පාලන ගිණුම

(b) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම **(AAT - AA2 - July 2018)**

## අභ්‍යාසය 78

2018 මාර්තු මාසයට අදාළ පහත සඳහන් අගයන් සීමාසහිත ඔශ' (පෞද්ගලික) සමාගමේ පොත්වලින් උපුටාගන්නා ලදී.

| | රු. |
|---|---:|
| අඩු කිරීම්වලට පෙර දළ වැටුප | 9,600,000 |
| උපයන විට ගෙවන බදු (PAYE) | 325,000 |

සමාගම, දළ වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා [Employees' Provident Fund (EPF) 12% ක් සහ සේවක භාරකාර අරමුදල සඳහා [Employees' Trust Fund (ETF)] 3% බැගින් දායක වේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා (EPF) සේවකයන්ගේ දායකත්වය 8% කි.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු මාසය සඳහා වන ශුද්ධ වැටුප වන්නේ,

(1) රු. 7,355,000/- (2) රු. 8,507,000/- (3) රු. 9,275,000/- (4) රු. 7,067,000

**(AAT - AA2 - January 2019)**

## අභ්‍යාසය 79

**සීමාසහිත හිරුන් (පෞද්ගලික) සමාගමේ** 2015 දෙසැම්බර් මාසය සඳහා වැටුප් ලේඛනයේ (payroll) සාරාංශය පහත දී ඇත.

| | රු. |
|---|---:|
| දළ වැටුප | 7,570,000 |
| අඩු කිරීම්: | |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) 8% | (605,600) |
| ශුද්ධ වැටුප | **6.964,400** |

සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) 12% බැගින් ද සේවක භාර අරමුදලට (EPF) 3% බැගින් ද දායකවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

මුදල් සම්බන්ධිත සටහන් ද ඇතුළුව, **සීමාසහිත හිරුන් (පෞද්ගලික) සමාගමේ** වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගෙවීම් සහ සේවක භාර අරමුදල් (ETF) ගෙවීම් සටහන් කිරීම සඳහා ජ'නල් සටහන් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

**(AAT - AA2 - January 2016)**

## Examiner's *Comment*



වැටුප් සම්බන්ධ ජර්නල් සටහන් ඉල්ලා ඇතත් ඇතැම් අයදුම්කරුවන ලෙජර් ගිණුම් ඉදිරිපත් කර තිබුණි. තවත් කොටසක් ජර්නල් සටහන් සහ ලෙජර් ගිණුම් ඉදිරිපත් කරමින් අනවශ්‍ය ලෙස කාලය මිඩංගු කර තිබුණි. සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් සේවා යෝජකයාගේ දායකත්වය හා සේවක භාර අරමුදලට දායකත්වය ඇතැම් අයදුම්කරුවන් විසින් ශුද්ධ වැටුප මත ගණනය කර තිබුණි. එක් එක් අරමුදලේ දායකත්ව ප්‍රතිශතයන් නිවැරදිව නොදන්නා අයදුම්කරුවන් ද විය. සමහර අයදුම්කරුවන් නිවැරදිව හර සටහන් සහ බැර සටහන් හඳුනා නොගෙන ජර්නල් සටහන් පිළියෙල කර තිබුණි. ප්‍රශ්නය නිසි පරිදි කියවා අවබෝධ කර නොගෙන පිළිතුරු සැපයීම මූලික දුර්වලතාවය විය.

## අභ්‍යාසය 80

සීමාසහිත X සමාගමේ 2016 ජුනි මාසයේ වැටුප් ලේඛනයෙන් (payroll), පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී,

| | රු. |
|---|---|
| සේවකයන්ගේ දළ වැටුප් | 575,000 |
| වැටුප් වලින් අඩුකරගත් ණය වාරික | 75,000 |
| සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍යයාගේ දායකය | 69,000 |
| සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවකයන්ගේ දායකය | 46,000 |
| සේවක භාර අරමුදලට (ETF) සේව්‍යයාගේ දායකය | 17,250 |
| සේවකයන්ගෙන් අඩුකර ගත් උපයන විට ගෙවන බදු (PAYE) | 20,000 |

2016 ජුනි මාසය සඳහා සේවකයන්ට ගෙවිය යුතු ශුද්ධ වැටුප් වන්නේ,

(1) රු. 434,000/- කි (2) රු. 416,750/- කි

(3) රු. 347,750/- කි (4) රු. 454,000/- කි **(AAT - AA2 - July 2016)**

## අභ්‍යාසය 81

**සීමාසහිත Y සමාගමේ** පොත් වලින් 2013 දෙසැම්බර් මාසය සඳහා පහත දැක්වෙන වැටුප් වාර්තා උපුටාගෙන තිබේ.

| | | |
|---|---|---|
| මුළු දළ වැටුප | (රු.) | 162,000 |
| වාර්ෂික ප්‍රසාද ගෙවීම | (රු.) | 162,000 |
| වෙනත් දීමනාවල එකතුව | (රු.) | 68,000 |
| අඩුකළ යුතු වැටුප් අත්තිකාරම් | (රු.) | 25,000 |
| උපයන විට ගෙවීම (Paye) අඩු කිරීම් | (රු.) | 2,200 |
| බැංකු ණය සඳහා අඩු කිරීම් | (රු.) | 3,500 |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකය | | |
| සේව්‍ය | | 12% |
| සේවක | | 8% |
| සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකය | | |
| සේව්‍ය | | 3% |
| මේ මාසයේ දී අයකර ගත යුතු පසුගිය මාසයේ වැඩිපුර ගෙවූ ශුද්ධ වැටුප් (සේවක අර්ථ සාධක අරමුදල අඩු කර සේවක භාරකාර අරමුදල සමග ගෙවා ඇත.) | (රු.) | 4,600 |

- සමාගමේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙත වන්නේ වැටුප් සම්බන්ධ ගනුදෙනු මාසයේ අවසාන දිනයේ සටහන් කිරීම සහ ශුද්ධ වැටුප් හා අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ඊළඟ මාසයේ 5 වන දිනයේ ගෙවීමත්ය.
- සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායක, ප්‍රසාද දීමනා මත ගණයන කරනු නොලැබේ.

ඔබ විසින්, 2013 දෙසැම්බර් මාසය සඳහා සීමාසහිත Y සමාගමේ වැටුප් පාලන ගිණුම පිළියෙල කළ යුතුය. (ලකුණු 06)

**(AAT - January 2014)**

## අභ්‍යාසය 82

2017 මාර්තු මාසය සඳහා සීමාසහිත සිල්වර් (පෞද්ගලික) සමාගමේ වැටුප් ලේඛනයේ (payroll) සාරාංශය පහත සඳහන් පරිදි විය.

| මූලික වැටුප (රු.) | අතිකාල (රු.) | සේවක අර්ථසාධක අරමුදලට අඩු කිරීම් 8% බැගින් (රු.) | ශුද්ධ වැටුප (රු.) |
|---|---|---|---|
| 725,000 | 91,000 | (58,000) | 758,000 |

සමාගම, මූලික වැටුපෙන්, සේවක අර්ථසාධක අරමුදලට (Employees' Provident Fund - EPF) 12% බැගින් ද, සේවක භාරකාර අරමුදලට (Employees' Trust Fund - ETF) 3% බැගින් ද, දායක වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු මාසය සඳහා සීමාසහිත සිල්වර් (පෞද්ගලික) සමාගමේ, ඉහත සඳහන් වැටුප්, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවකයන්ගේ භාරකාර අරමුදල (ETF) සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් ගනුදෙනුවලට අදාළ සටහන් ද ඇතුළුව, පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - July 2017)**

## අභ්‍යාසය 83

(1) සීමාසහිත ග්‍රේ සමාගමේ 2013 ජූනි මාසය සඳහා වූ පඩිපතෙන් (payroll) පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | රු. |
|---|---|
| සේවකයන්ගේ දළ වැටුප් | 896,700 |
| සේවකයන්ගෙන් අඩු කර ගත් ණය වාරික | 120,500 |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය දායකය | 114,600 |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක දායකය | 76,400 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) සඳහා සේව්‍ය දායකය | 28,650 |
| සේවකයන්ගෙන් අඩු කර ගත් උපයන විට ගෙවීම් (PAYE) | 29,780 |

2013 ජූනි 30 දිනට සේවකයන්ට ගෙවිය යුතු ශුද්ධ වැටුප හා ව්‍යවස්ථාපිත වගකීම් (statutory liabilities) පිළිවෙලින්,

(1) රු. 631,820/- සහ රු. 143,250/- වේ.
(2) රු. 670,020/- සහ රු. 249,430/- වේ.
(3) රු. 671,150/- සහ රු. 249,430/- වේ.
(4) රු. 746,420/- සහ රු. 191,000/- වේ. **(AAT - July 2013)**

(2) පහත දී ඇති තොරතුරු සීමාසහිත රේ ෂෝ (පෞද්ගලික) සමාගමේ පොත්වලින් 2011 දෙසැම්බර් මාසය සඳහා උපුටා ගන්නා ලදී.

| | රු. | | රු. |
|---|---|---|---|
| මූලික වැටුප | 650,000 | ණය වාරික | 52,000 |
| ස්ථාවර දීමනා | 175,000 | උපයන විට ගෙවීමේ බදු | 7,500 |
| අතිකාල | 225,000 | සේවක අර්ථසාධක අරමුදල (EPF) 8% | 66,000 |
| | | සේවක අර්ථසාධක අරමුදල 12% | 99,000 |
| | | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) 3% | 24,750 |
| | **1,050,000** | | **249,250** |

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගත් විට, මාසය සඳහා සේවකයන්ට ගෙවිය යුතු ශුද්ධ වැටුප වන්නේ,

(1) රු. 800,750/- (2) රු. 924,500/-
(3) රු. 825,500/- (4) රු. 249,250/-

**(AAT - January 2012)**